## 379 පැතිබර වන මල්

පැතිබර වන මල් අතුම්ණි දැදිරිව
පිතිබර හිමිදිරියේ
මල් ලොවැ රැජිණිය ඔබ බව පවසයි
ලෝක දයාබරියේ
මිහිකත වටකොට සත්මහ සමුදුර
සෝදන දිය සරියේ
ඔබමය රැජිණිය ඔබමය රැජිණිය
ඔබමය මව් මරියේ

මල් ලොවැ මංගලියේ
ලෝක දයාබරියේ
ලෝ කිරිටය ඔබෙ හිස මත තබමින්
නමෝ නමෝ මරියේ

පව්බර අප වෙත මව් පෙම් වඩවා
කරුණා නයන හෙලා
දිරි ගන්වනු මැන අප සිත් දින දින
ඔබෙ පුත් රුවන බලා
නිති සරණය දෙන මරි මව කඩ නොව
නංවන අසිරිවලා
රැජිණිය රැජිණිය සලසනු රැජිණිය
අප වෙත එන්න ගලා